

# නගර සභාවේ කාර්යභාරය හා එය ක්‍රියාත්මක වීම

**අපද්‍රව්‍ය අර්බුදය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා සෘජු බලපෑමක් කරයි. පළාත් පාලන ආයතන සතු ප්‍රධාන වගකීම ලෙස නගර පවිත්‍රතාව ක්‍රියාත්මක වන නමුත් තවමත් ලංකාවේ බොහෝ ප්‍රධාන නගර මෙම ගැටළුවෙන් පීඩා විඳියි.**

හේතුව ක්‍රමවත් වූ සංවර්ධන හා කළමනාකරණ ව්‍යාපෘති හඳුන්වා නොදීමයි. අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 25% ක් පමණ ජනනය වන කොළඹ නගරය අද පාරිසරික හා සෞඛ්‍ය ගැටළු රාශියකට ගොදුරුවී සිටී.

එනිසා මෙය අවම කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වැඩසටහන් හා ආයතනික කාර්යභාරය පිළිබඳ එහි අධ්‍යක්ෂ ඉංජිනේරු (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ) ලලිත් වික්‍රමරත්න මහතා සමග කළ සාකච්ඡාවකි මේ.

**ප්‍රශ්නය :- ලංකාවේ නගරසභාව සතු ආයතනික කාර්යභාරය කුමක් ද?**

නගර සභාව සතු ප්‍රධාන වගකීම හා යුතුකම නම් නගරය පිරිසුදුව හා අලංකාරමත්ව තබා ගැනීමයි. එක්දහස් අටසිය ගණන්වල නගරසභාව හඳුන්වාදෙනු ලැබුවේත් මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහායි. ඒ අනුව වර්තමානයේත් නගරය පිරිසුදුව තබා ගැනීමට කළ යුතු සියල්ල ආයතනික මට්ටමින් ඉටුකර එහිදී පාරවල් අතුගෑම, මැදීම නගරයේ තාප්ප පුරා අලවා ඇති දැන්වීම් පත්‍රිකා ඉවත් කිරීම කාණු සුද්ද පවිත්‍ර කිරීම වැනි කටයුතු සිදුකරනවා.

**සෑම කොට්ඨාසයම පවිත්‍රතාඩිපෝවක් පිහිටුවා ඒ මගින් කොළඹ නගරයේ සියලු පිරිසුදු කිරීම් කටයුතු දෛනිකව ක්‍රියාත්මක කරයි. මීට අමතරව කොළඹ නගර සභාව විශේෂ අත්හද බැලීමක් සිදු කළා. එනම් කොළඹ නගරයේ නාගරික දිස්ත්‍රික්ක 03 ක් පෞද්ගලික අංශයට බාරදීම. ඒවායේ රාජ්‍ය අංශයේ සේවකයන් වැඩ කරන්නේ නැහැ.**

එමෙන්ම අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා විශේෂ අවධානයක් ද යොමුකරනවා. මේ අනුව නිරන්තරයෙන් ම නගරයේ සුන්දරත්වයත්, පවිත්‍රතාවත් ආරක්ෂා කිරීමයි නගර සභාවේ මූලික කාර්යභාරය වන්නේ.

**ප්‍රශ්නය :-මෙවැනි කාර්යභාරයක් ඇති ආයතනයක් ලෙස කොළඹ මහනගරසභාව එම කාර්යය කෙසේ ඉටුකරන්නේද?**

කොළඹ මහනගර සභාව කොළඹ නගරයේ පිරිසිදුකම් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරනවා. මේ නිසා ම අදාළ කටයුතු විමධ්‍යගත කර ඇත. ඒ අනුව කොළඹ නගරය කොටස් 06 කට බෙද ඒවා නාගරික දිස්ත්‍රික්ක ලෙස කොටස්කර තිබෙනවා. එම දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුවරයෙක් පත්කර ඇති අතර ඔහු යටතේ නැවත් කොටස් 08 ක් සිටින ලෙස නාගරික කොට්ඨාස 48 කට බෙදල තිබෙනවා. එම සෑම කොට්ඨාසයම පවිත්‍රතා ඩිපෝවක් පිහිටුවා ඒ මගින් කොළඹ නගරයේ සියලු පිරිසුදු කිරීම් කටයුතු දෛනිකව ක්‍රියාත්මක කරයි. මීට අමතරව කොළඹ නගර සභාව විශේෂ අත්හද බැලීමක් සිදු කළා. එනම් කොළඹ නගරයේ නාගරික දිස්ත්‍රික්ක 03 ක් පෞද්ගලික අංශයට බාරදීම. ඒවායේ රාජ්‍ය අංශයේ සේවකයන් වැඩ කරන්නේ නැහැ. මෙසේ පෞද්ගලික අංශයට පවරාදීමේදී ප්‍රධාන අරමුණු 03 ක් ඉටුකර ගැනීමට අපේක්ෂා කළා.

01. පුද්ගලික අංශය හා රාජ්‍ය අංශය අතර තරගකාරිත්වයක් ඇතිකිරීම

02. වෙනස් කළමනාකරණයක් ඇති කිරීම

03. නවීන තාක්ෂණික ක්‍රමවේද ගෙනඒම යන කරුණුයි.

**ප්‍රශ්නය :- ආයතනය අපේක්ෂා කළ මෙම අරමුණු ඒ අයුරින්ම ඉටුවී තිබෙනවා ද?**

බොහෝ දුරට සාර්ථකයි. උතුරු කොළඹ මැද කොළඹ සහ බටහිර කොළඹ මෙම පෞද්ගලික අංශයට පවරා තිබෙනවා.

එහිදී පෞද්ගලික අංශය අයත් කොටස පිරිසිදුව



තිබෙන විට එම මාර්ගයේ ම ඊළඟ කොටස රාජ්‍ය අංශය පවිත්‍ර කර නොමැති නම් එය හොඳින් කැපී පෙනෙනවා. මේ නිසා රාජ්‍ය අංශයේ සේවකයන් ද තමන්ට අයත් කොටස පිරිසිදු කිරීම කරනවා. ඒමෙන් ම නවීන තාක්ෂණය ලබාගැනීමේදීත් පෞද්ගලික අංශය ශක්තිමත්. බොහෝ විට රාජ්‍ය ආයතනවලට යමක් මිලදී ගැනීමේ දී වැඩි මුදලක් වැයකිරීමට සිදුවෙනවා. නමුත් පෞද්ගලික අංශයට මෙය තරමක් පහසු කාර්යයක්. පෞද්ගලික අංශයට අයත් කොටුව, පිටකොටුව වැනි ස්ථානයන්හි මාර්ග පවිත්‍ර කිරීම අද යන්ත්‍ර මගින් සිදු කරන්නේ. නමුත් රාජ්‍ය අංශයට මෙම කටයුත්ත කළ නොහැකිය.

ප්‍ර :- **මේ කුමන ආකාරයට පිරිසිදු කිරීම් කළත් නගරය අපවිත්‍රයි කියන චෝදනාවෙන් නගරසභාවට මිදෙන්න බැහැ නේද?**

1997 පමණ වන තෙක් ම කොළඹ නගරය පුරා විශාල කුණු ගොඩවල් ප්‍රමාණයක් තිබුණා. ඒ අනුව කසළ ගොඩවල් 1250 ක් පමණ පාරේ දක්නට තිබුණා. මේ නිසා මදුරුවො, මැස්සො බෝවීම, වර්ෂා කාලයට මේවා කාණු පද්ධතියට එකතුවීම නිසා විවිධාකාර වූ රෝග බෝවීමත් සිදුවුණා. එම තත්ත්වය අවබෝධ කර ගත් නගරසභාව පාරේ කුණු දැමීම වැළැක්වීම සඳහා 1997 සිට ගෙන් ගෙට ගොස් කසළ එකතු කිරීම ආරම්භ කළා. එහි ප්‍රතිඵලයක් ලෙස අද වන විට මෙම කුඩා කසළ ගොඩවල් ප්‍රමාණය 200 දක්වා අඩු කර ගැනීමට හැකිවී තිබෙනවා.

ප්‍ර :- **මෙසේ ගෙන් ගෙට කසළ එකතු කළත් එය ඉතා අකාර්යක්ෂම බව හා සතියකට හෝ දෙකකට වරක් පමණ මෙය සිදුවෙන බව මතයයි. ඒ නිසා ඔවුන් ආයතනය පිළිබඳ විශ්වාසය තබන්නේ නැහැ නේද?**

ඇත්තෙන් ම ගෙන් ගෙට කසළ එකතු කිරීම දුෂ්කර කාර්යයක්. මේ සඳහා විශාල වියදම් යනවා. සේවකයින්ට සහ වාහන සඳහා. නමුත් ජපන් රජයේ ආධාර යටතේ විශාල වාහන ප්‍රමාණයක් ලබාගෙන මෙම කාර්යය කළා. එහෙත් එය සාර්ථක වූයේ මධ්‍යම හා වැඩි ආදායම්ලාභී ප්‍රදේශවලයි. මෙහිදී නියමිත වේලාවට කසළ එකතු කිරීමක් සිදුවෙන් නෑ. කසළ එකතු කිරීම බොහෝවිට කළේ දිනකට වරක් පමණයි. එහෙත් 50% ක් පමණ ඇති පැල්පත් වාසීන්ට දෛනික අපද්‍රව්‍ය ප්‍රමාණය හෝ තබා ගැනීමට ඉඩක් නැහැ. ඒ නිසා කසළ අරගෙන ලොරිය එතැනින් ඉවත් වී විනාඩි කිහිපයකින් නැවතත් පාරේ කසළ ගොඩ ගැසෙනවා. මේ නිසාම ඔවුන්ට බඳුන් ලබා දුන්නා. එය තරමක් සාර්ථක වූ ව්‍යාපෘතියක්. නමුත් මේ කුමන ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වුවද ජනතාවගේ දැනුවත්බව, කැපවීම හා වුවමනාව නැතිනම් එම කටයුත්ත සාර්ථක වෙන්නේ නැහැ. කොළඹ නගරයේ මෙන්ම ලංකාවේ අනෙක් නගරවලත් ඝන අපද්‍රව්‍ය ගොඩවල් වැඩිවීමට හේතු ජනතාවගේ නොදැනුවත්කම හා කැපවීමක් කිරීමට අකමැති වීම.

ප්‍ර :- **මෙම තත්ත්වය ඔබ ආයතනය හඳුනාගෙන තිබියදීත් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ නැති ද?**

කොළඹ මහනගර සභාව, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉදිරියෙන් ම සිටිනවා. මෙහි ඝන අපද්‍රව්‍ය අංශය මගින් ඝන අපද්‍රව්‍ය අධ්‍යයන අංශය ලෙස කණ්ඩායමක් පිහිටුවා තිබෙනවා. මොවුන් ගෙයින් ගෙට ගොස් නිවැසියන් දැනුවත් කිරීම කරනවා. එහිදී අපද්‍රව්‍ය බැහැර කිරීම, රැස් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට ඇති ගැටලු විමසා බැලීම හා ඒවාට විසඳුම් ලබාදීමත් සිදු කරනවා. මෙය දෛනිකව සිදුකරන ජංගම ප්‍රචාරක සේවයක්. එමෙන්ම වීදි නාට්‍ය රඟදැක්වීම මගින් ද ජනතාව දැනුවත් කිරීමට උත්සාහ කරනවා. ජනතාව රැස්වන ස්ථාන මෙන් ම අඩු ආදායම්ලාභී පවුල් වෙසෙන ජනාවාසවලට ගොස් ඔවුන්ට අවබෝධ කර ගත හැකි ආකාරයට කසළ අර්බුදය පිළිබඳ නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරනවා. එම ප්‍රදේශවලට මේ ක්‍රමය හොඳින් ගැළපෙනවා. රූපවාහිනිය, පුවත්පත්වල පළ කරන වෙළෙඳ දැන්වීම් වලින් ද කරන්නේ මෙම ජනතාව දැනුවත් කිරීම යි. එහෙත් තවමත් කසළ බඳුන පෙනි පෙනී ඒ අසල බිම කුණු දමා යන පිරිස් නැතුවා නොවේ. ඒ සඳහා මිනිසුන්ගේ චින්තනය වෙනස් කළ යුතු ම යි. මාධ්‍ය ඒ සඳහා යොදගත හැකි අපූරු ම මෙවලම බවත් අමතක නොකළ යුතුයි.

**කොළඹ මහනගර සභාව, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඉදිරියෙන් ම සිටිනවා. මෙහි ඝන අපද්‍රව්‍ය අංශය මගින් ඝන අපද්‍රව්‍ය අධ්‍යයන අංශය ලෙස කණ්ඩායමක් පිහිටුවා තිබෙනවා. මොවුන් ගෙයින් ගෙට ගොස් නිවැසියන් දැනුවත් කිරීම කරනවා. එහිදී අපද්‍රව්‍ය බැහැර කිරීම, රැස් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට ඇති ගැටලු විමසා බැලීම හා ඒවාට විසඳුම් ලබාදීමත් සිදු කරනවා. මෙය දෛනිකව සිදුකරන ජංගම ප්‍රචාරක සේවයක්.**



ප්‍ර :- **ඔබ ප්‍රකාශ කරන ආකාරයට අද වැඩි පිරිසක් නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කර නගරය පිරිසිදුව තබා ගැනීමට උත්සාහ කරනවා. නමුත් නගරසභාව යටතේ සිදුවෙන අවසන් බැහැර කිරීම සම්බන්ධව ගැටළු නැති බව ප්‍රකාශ කළ හැකි ද?**

මෙය නගර සභාවට තිබෙන ප්‍රධානම ගැටළුව යි. **කසළ දැමීමට සුදුසු ස්ථානයක් 1980 ගණන්වල සිටම සෙවුවා. නමුත් තවමත් ලැබිලා නැහැ.** ලෝක බැංකුව මගින් සනීපාරක්ෂක ලෙස කසළ අපහරණය කිරීම සඳහා වැඩසටහනක් ඉදිරිපත් කර මුදල් වෙන් කළා. ඉන් පසු එය ක්‍රියාත්මක කිරීමට මීපේ, වැලිසර වැනි ස්ථානවල ඉඩම් ලබා ගත්තා. නමුත් දේශපාලන හා ජනතාවගේ විවිධ බලපෑම් නිසා අපට ඉඩමක් සොයාගැනීම දුෂ්කර වුණා. වසර ගණනාවක් යනතුරුත් අපට ඉඩමක් සොයා ගැනීමට නොහැකි වූ නිසා ලෝක බැංකුව මෙම මුදල් නොදෙන බව ප්‍රකාශ කළා. ඉන්පසු නැවත පෙර පරිදි ම බ්ලූමැන්ඩල්වලට අපද්‍රව්‍ය බැහැර කිරීම කරන්නට පටන් ගත්තා.

ප්‍ර :- **ඉඩමක් ලබාගෙන සනීපාරක්ෂක ලෙස කසළ අපහරණය කිරීම අපද්‍රව්‍ය කළමනාකරණයේ එක් ක්‍රමයක් පමණයි. ලෝකයේ බොහෝ රටවල ජාතික ආදයමෙන් 10% - 12% අපද්‍රව්‍ය මගින් ලබා ගන්නවා. ශ්‍රී ලංකාවේ එවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක නොවෙන්නේ ඇයි.**

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 25% ක් කොළඹ නගරයෙන් ජනනය වෙයි. මෙම සියල්ල ක්‍රමවත් ලෙස බැහැර කිරීම ඉතා දුෂ්කරයි. ඒ සඳහා විශාල මුදලක් වැයවෙනවා. මේ නිසා රාජ්‍ය අංශයෙන් මෙය ක්‍රියාත්මක කිරීම අපහසු යි. මේ නිසා පරිසරය පිළිබඳ කතා කරන බොහෝ අයට කතා කර මෙම අභියෝගය බාර දුන්නා. නමුත් ගත්තේ නැහැ. පෞද්ගලික අංශයේ බොහෝ පිරිස් විදුලිය නිපදවීමට, කොම්පෝස්ට් නිපදවීමට, මෙම අපද්‍රව්‍ය යොදා ගත හැකි බව ප්‍රකාශ කළ නිසා ටෙන්ඩර් කැඳවනු ලැබුවා. එහිදී ඉඩම සොයා ගැනීම, තාක්ෂණික, මුදල වසර 25 ක් යනතෙක් නඩත්තුව තමන් සොයාගත යුතුයි යන කොන්දේසි සමගයි මෙය කළේ. ඒ නිසා මේ සඳහා ඉදිරිපත් වුණේ තුන්දෙනෙක් විතරයි. අවසානයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට එකඟ වුණා. ඒ අනුව දැන් එය ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර :- **කොම්පෝස්ට් සඳහා යොදගත හැකි වෙන්නේ කෙටිකාලීනව ජීර්ණයවන අපද්‍රව්‍ය පමණයි. නමුත් නගරාශ්‍රිත ප්‍රදේශවල දිගුකාලීන ජීර්ණය වන අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩියි. මේවා ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හැකි නම් ඉවත දැමීමට ඉතිරි වන අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කර ගත හැකියි. එවිට බ්ලූමැන්ඩල්වල මෙන් විශාල කසළ කඳු ගොඩ ගැසෙන්නේ නැහැනේද?**

ඇත්තෙන්ම ඔව්. බ්ලූමැන්ඩල්වල කසළ කන්ද පරිසර දූෂණයටත් ප්‍රබල ලෙස බලපානවා. මීතේන් වායුව නිෂ්පාදනය වෙන නිසා නිතර ගිනි ගැනීම ද සිදුවේ. මෙසේ ඉවත දමන කසළ ප්‍රමාණය අඩු කරගත හැකි වෙන්නේ ප්‍රතිචක්‍රීකරණයෙනි. කඩදසි, ප්ලාස්ටික්, වීදුරු මෙම තත්ත්වයට අයත්. කොළඹ නගරයේ මධ්‍යම හා ඉහළ පාන්තිකයන්ට කසළ වෙන්කර දැමීමේ ක්‍රමය හඳුන්වා දී තිබෙනවා. එහිදී නගරසභාව මගින් පොලිසැක් නැමැති බෑග් තුනක් ලබාදී කඩදසි වීදුරු, ප්ලාස්ටික් වෙන්වෙන්ව දමන්නට උපදෙස් ලබාදී තිබෙනවා.



**මෙහිදී ජනතා කැපකිරීම අත්‍යවශ්‍යයි. නගර සභාවට සියල්ල පවරා නිහඬවීමෙන් ගටළු විසඳෙන්නේ නැහැ. නගරසභාව තම කාර්යය භාරය නිසි ලෙස ඉටු නොකරයි නම් ප්‍රදේශවාසීන් ඔවුන් සමග සාකච්ඡා කර සම්මුතියකට එළඹිය යුතුයි. ඉන්පසු දෙපිරිස ම තමාගෙන් ඉටු විය යුතු යුතුකම ඉටු කළ යුතු යි. එවිට ලබාදී ඇති ප්‍රතිපාදන හා සේවකයින් ප්‍රමාණය ප්‍රමාණවත් වෙනවා.**

මෙම වසර කිහිපය තුළ මෙය තරමක් සාර්ථක වී ඇති බව අපේ දෛනික අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් අවබෝධ කරගත හැකියි. 2002 වර්ෂයේ දිනකට ටොන් 770 ක් වූ අතර 2003 දී ටොන් 680 කි. 2004 වසරේදී එම ප්‍රමාණය ටොන් 620 දක්වා අවම කර ගැනීමට සමත් වී තිබේ. නමුත් රාජ්‍ය අංශයට පමණක් මෙම කාර්යය කළ නොහැකි බව සත්‍යයක්.

**ස්වභාවික හා පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමත් බලයට පත්වෙන රජයක වගකීම. ඒ සඳහා මුදල් වැය කළ යුතුයි. එසේ නැතිනම් පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන එම කාර්යය ඉටු කළ යුතුයි නේද?**

රජය මෙම කාර්යය ඉටුකිරීමට අනිවාර්යයෙන්ම බැඳී සිටිනවා. නමුත් ජනතාව රජයට ම මෙය පවරා මාර්ගය අසළ කසළ දැමීම නොකළ යුතුයි. එවිට සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න විදිහක් නැහැ. හැමදමත් එකම තැන ඉන්නෙ. ඒ නිසා ජනතාවත් කැපවීම් කළ යුතුයි. ආයතනයත් නිසි ලෙස ජනතාවගේ විශ්වාසය දිනාගත යුතුයි. දෙපිරිසම අතර ගොඩගැගෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාව මත මෙම කාර්යය පහසුකර ගැනීමට හැකියි. නමුත් බොහෝ ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජනතාව අතර මෙම බැඳීම නොමැතිකම 'කසළ' අර්බුදයක් බවට පත්වීමට හේතු වී තිබෙනවා.

ප්‍ර :- **කොළඹ නගරයේ පවිත්‍රතාවට තරම් අනෙකුත් නගරවල පවිත්‍රතාවට මුදල් වෙන් කරන්නේ නැහැ. සේවකයින් ප්‍රමාණයත් අඩුයි. කොළඹ මහනගර සභාවේ සේවකයින් 1900 ක් වන විට සීතාවකපුර නගර සභාවේ සේවකයින් ගණන 26 යි. මේ තත්ත්වය යටතේ පවිත්‍රතාව සාර්ථක කරගන්නේ කෙසේ ද?**

ජනතා කැපකිරීම අත්‍යවශ්‍යයි. නගර සභාවට සියල්ල පවරා නිහඬවීමෙන් ගටළු විසඳෙන්නේ නැත. නගරසභාව තම කාර්යය භාරය නිසි ලෙස ඉටු නොකරයි නම් ප්‍රදේශවාසීන් ඔවුන් සමග සාකච්ඡා කර සම්මුතියකට එළඹිය යුතුයි. ඉන්පසු දෙපිරිස ම තමාගෙන් ඉටුවිය යුතු යුතුකම ඉටු කළ යුතුයි. එවිට ලබාදී ඇති ප්‍රතිපාදන හා සේවකයින් ප්‍රමාණය ප්‍රමාණවත් වෙනවා. දෙපිරිසේ ම චින්තනය වෙනස් කර ගැනීම නගර පිරිසිදුව තබා ගැනීමට හේතුවෙනවා. නමුත් ඉන් පසු එම අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වගකීම බවත් අමතක කරන්න බැහැ. එසේ නිසි කළමනාකරණයක් ඉදිරියටත් සිදුනොවුණොත් මෙම අර්බුදය හැමදමත් පවතීවි. එනිසා ප්‍රතිචක්‍රීකරණ හෝ වෙනත් දිගුකාලීන ක්‍රමවත් ව්‍යාපෘති පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශය දැන් සිට හෝ අවධානය. යොමුකළ යුතුයි.

**සාකච්ඡාව - කොළඹ නගර සභාවේ අධ්‍යක්ෂක ඉංජිනේරු (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ)**

**ලලිත් වික්‍රමරත්න**

**සටහන -**

**චම්පිකා ශිරෝමාලා**